විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

මහලේකම් කාර්යාලය, මාළිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை செயலகம், மாளிகாவத்தை, கொழும்பு 10. Maligawatte Secretariat, Maligawatte, Colombo 10.

අංකය / இல. / No. විවැ/චක්‍රලේඛ/2010 දිනය / திகதி / Date 2010- 12- 13

**විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 12/2010**

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

**<u>පළාත් පාලන විශ්‍රාම වැටුප් මාසික ගෙවීමේ ලේඛණ පිළියෙල කිරීම සහ ලිපිගොනු භාරකාරත්වය ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත විමධ්‍යගත කිරීම</u>**

## 01. පසුබිම

පළාත් පාලන විශ්‍රාම වැටුප් සහ පළාත් පාලන සේවා වැන්දඹු අනත්දරු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය 1974 අංක 16 දරණ පළාත් පාලන සේවා පනත සහ ඒ යටතේ පැනවූ අරමුදල් යටතේ ක්‍රියාත්මක විය. පළාත් සභා යටතේ පළාත් රාජ්‍ය සේවය ස්ථාපිත වීමත් සමඟ පළාත් පාලන සේවා කාර්ය මණ්ඩලයන් ද පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය විය. ඒ අනුව 1993- 09- 03 දිනට පෙර විශ්‍රාම ලැබූ පළාත් පාලන නිලධාරීන් වෙනුවෙන් පළාත් පාලන විශ්‍රාම වැටුප් ක්‍රමය තවදුරටත් ක්‍රියාත්මක වේ. පළාත් පාලන අධ්‍යක්ෂවරයා යටතේ ක්‍රියාත්මක වූ පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රමය 1990- 01- 01 දින සිට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත පවරා ඇත. ඉහත විශ්‍රාම වැටුප් ක්‍රමයේ වත්මන් බලධාරියා විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වරයා වේ.

පළාත් පාලන විශ්‍රාම වැටුප් ලිපිගොනු මෙම දෙපාර්තමේන්තුවේ පළාත් පාලන විශ්‍රාම වැටුප් ඒකකය විසින් දැනට නඩත්තු කෙරේ. විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 7/ 98 අනුව මාසික විශ්‍රාම වැටුප් ගෙවීම් කටයුතු 1999- 01- 01 දින සිට ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමට විමධ්‍යගත කළ අතර, ගෙවීම් කටයුතු සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන මෙම කාර්යාලය මඟින් ලබා දුනි.

රජයේ විශ්‍රාම වැටුප් බැංකු පද්ධතිය හරහා ක්‍රියාත්මක කිරීම යටතේ 2006 මාර්තු සහ 2007 අප්‍රේල් (උතුරු/ නැගෙනහිර) සිට ගෙවීම් ක්‍රියාවලිය තවදුරටත් විමධ්‍යගත කළ අතර, මාසික විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා ලබාදුන් මුදල් ප්‍රතිපාදනද නතර කොට ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා ලබා දෙන මුදල් ප්‍රතිපාදන උපයෝගී කොටගෙන ගෙවීම් කටයුතු සිදුකිරීමටත් එම වියදම් අදාල වැය ශීර්ෂයට බැර කිරීමටත් උපදෙස් ලබා දී ඇත. ඒ යටතේ මාසික වෙනස්වීම් සහ ප්‍රාදේශීය ලේකම් විසින් වාර්තා කරනු ලබන මියයාම් පදනම් කොටගෙන වැටුප් ලේඛණ පිළියෙල කිරීම මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කෙරුණි.



| | Telephone | Fax | | Telephone | Fax | | Telephone | |
|---|---|---|---|---|---|---|---|---|
| Director General | 2431647 | 2342078 | W&OP | 2332346 | 2432214 | Policy | 2329580 | |
| Director | 2432008 | 2342078 | PSPF | 2324375 | 2332347 | Forces | 2320439 | |
| Director (F) | 2434974 | 2391403 | L.G.U. | 2342525 | 2342525 | Computation | 2434414 | E-mail: pensions@sltnet.lk |
| Internal Auditor | 2329634 | 2329634 | Registration | 2329178 | - | Payments | 2431612 | Web site: www.pensions.gov.lk |

## 02. විමධ්‍යගත කිරීමේ ක්‍රියාවලිය

පළාත් රාජ්‍ය සේවය ස්ථාපිතවීමෙන් පසු විටින් විට පළාත් පාලන මාසික විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය විමධ්‍යගත කළ අතර, දැනට මෙම කාර්යාලයෙන් වැටුප් ලේඛණ පිළියෙල කිරීම හා ලිපිගොනුවල භාරකාරත්වයට පමණක් සීමා වී ඇති ගෙවීම් ක්‍රියාවලිය පූර්ණ වශයෙන්ම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත විමධ්‍යගත කිරීමට මෙම දෙපාර්තමේන්තුව තීරණය කර තිබේ. ඒ අනුව 2011- 01- 01 දින සිට එම විමධ්‍යගත කිරීම සිදුකෙරේ. ඒ අනුව මාසික වැටුප් ලේඛණ පිළියෙල කිරීමත්, ලිපිගොනුවල භාරකාරත්වයත්, ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත පැවරෙනු ඇත. මෙම ක්‍රියාවලිය අපහසුතාවයකින් තොරව ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් වැඩපිළිවෙල හඳුන්වා දී තිබේ .

I. 2011- 01- 01 දින සිට පළාත් පාලන සේවා, පළාත් පාලන වැන්දඹු අනත්දරු සහ පළාත් පාලන වැන්දඹු පුරුෂ අනත්දරු වැටුප් ලේඛණ පිළියෙල කිරීම අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සිදුකළ යුතු අතර, පළාත් පාලන ඒකකය මඟින් 2011 ජනවාරි මස සිට ගෙවීම් ලේඛණ පිළියෙල කිරීමක් සිදු නොවේ. 2011 ජනවාරි මස සිට ඔබ විසින් පිළියෙල කරන ලද ගෙවීම් ලේඛණය පදනම් කරගෙන වැටුප් ලේඛණ පිළියෙල කළ යුතු අතර, පළාත් පාලන විශ්‍රාම වැටුප් ලිපිගොනු ඔබ කාර්යාලයට ලැබෙනතුරු ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතර මාරුකිරීම් සිදු නොකළ යුතුය. ලිපිගොනු ඔබ වෙත ලැබීමෙන් අනතුරුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතර, මාරුකිරීම් සිදුකිරීමට කටයුතු කළ හැකිය. (කඩිනමින් ලිපිගොනු ඔබ වෙත එවීමට ක්‍රියාකරන අතර, එය ලැබෙන තෙක් ඔබගේ ගෙවීම් ලේඛණය අනුව ගෙවීම් කිරීමට ක්‍රියා කළ යුතුය).

II. විශ්‍රාමිකයන් ජීවත්වන බව සනාථ කරගැනීම සඳහා වාර්ෂිකව පදිංචි සහතික ලබාගතයුතු අතර, වාර්තාවන මියයාම් අප්‍රමාදව වැටුප් ලේඛණ වලින් අඩුකිරීමටත්, කටයුතු කිරීම ද, මියයන විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් නතර කිරීමටත්, අනත්දරු විශ්‍රාම වැටුප නියමිත දිනට නතර කිරීමටත්, හිමිකම් අහිමි වූ විශ්‍රාම වැටුප් පිළිබඳ වාර්තා වන අවස්ථාවලදී අප්‍රමාදව වැටුප් නතර කිරීමටත් කටයුතු කළ යුතුය.

III. අදාල මාසයේ වියදම් වාර්තා දිස්ත්‍රික් ලේකම් වෙත ඊළඟ මාසයේ 05 වන දිනට පෙර ලබා දීමට කටයුතු කිරීම. ඒ සඳහා “ඇමුණුම් 01” ආකෘතිය උපයෝගී කර ගත යුතුය.

IV. දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් තම දිස්ත්‍රික්කය තුළ ඇති සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාල මාසික වියදම් පිළිබඳව ඒකාබද්ධ වාර්තාවක් පිළියෙල කර ඊළඟ මාසයේ 25 දිනට ප්‍රථම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ පළාත් පාලන ඒකකය වෙත එවීමට කටයුතු කිරීම. මේ සඳහා අමුණා ඇති “ඇමුණුම් 02” භාවිතා කළ යුතුය.

V. පළාත් පාලන සේවා සිවිල් විශ්‍රාමිකයෙකු මියගිය විට කලත්‍රයා සඳහා වැන්දඹු විශ්‍රාම වැටුපක් ඉල්ලුම් කරන්නේ නම්, කලත්‍රයාගේ ඉල්ලීමත් විශ්‍රාමිකයාගේ වැන්දඹුව හා අනන්දරුවන් පිළිබඳ වාර්තාවත් සමඟ සිවිල් ගොනුව, වැන්දඹු විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රය නිකුත් කිරීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ පළාත් පාලන ඒකකය වෙත යොමු කිරීම. තවදුරටත් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රදානය මෙම දෙපාර්තමේන්තුව විසින් සකස්කොට ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත එවීමට ක්‍රියාකරනු ලැබේ. (සිවිල් විශ්‍රාම වැටුප් ගොනුව එවීමේදී, සිවිල් විශ්‍රාම වැටුප නැවැත්වූ මාසය සහ අවසන් වරට ගෙවූ වැටුප සඳහන් කර ලිපියක් ගොනුවට ඇතුලත්කර එවීමටද කටයුතු කිරීම).

VI. සිවිල් විශ්‍රාම වැටුපකට අදාලව දස අවුරුදු සංශෝධනය සඳහා විශ්‍රාමිකයකු ඉල්ලුම් කළ විට ඔබ විසින් දස අවුරුදු සංශෝධනය සකස්කර ගෙවීමටත්, විශ්‍රාම වැටුප් සංශෝධනයක් සඳහා ඉල්ලීමක් ලැබුණු විට සංශෝධනය ප්‍රදාන පත්‍රයක් නිකුත් කිරීම සඳහා අදාල ඉල්ලීම සිවිල් ගොනුව ද සමඟ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ පළාත් පාලන ඒකකය වෙත යොමු කිරීම.

පළාත් පාලන විශ්‍රාමිකයින්ගේ නව ප්‍රදානයන් නිකුත් කිරීමත්, ප්‍රතිශෝධන නිකුත් කිරීමත්, පළාත් පාලන වැන්දඹු, වැන්දඹු පුරුෂ, අනත්දරු සහ ආබාධිත ප්‍රදානපත්‍ර නිකුත් කිරීමත් යන කාර්යයන් තවදුරටත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ පළාත් පාලන ඒකකය විසින් සිදුකරනු ලැබේ. මෙම විධිවිධානයන්ට අනුව ක්‍රියාකරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

කේ. ඒ. තිලකරත්න
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්: 01. ජනාධිපති ලේකම්
02. ලේකම් - මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය.
03. ලේකම් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.
04. විගණකාධිපති.

ඇමුණුම් අංක 01

## පළාත් පාලන මාසික විශ්‍රාම වැටුප් වාර්තාව

(පළාත් පාලන සේවා/ පළාත් පාලන වැන්දඹු අනත්දරු/ පළාත් පාලන වැන්දඹු පුරුෂ හා අනත්දරු)

අදාල වර්ෂය: ............................ මාසය: .........................

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නම | පළාත් පාලන විශ්‍රාමිකයන් සංඛ්‍යාව | අදාළ මාසය සඳහා දරණ ලද වියදම | නතර කරන ලද විශ්‍රාම වැටුප් පිළිබඳ විස්තර | |
|---|---|---|---|---|
| | | | වි.වැ. අංකය | නම |
| | | | | |

- පළාත් පාලන සේවා/ පළාත් පාලන වැන්දඹු අනත්දරු/ පළාත් පාලන වැන්දඹු පුරුෂ හා අනත්දරු සඳහා වෙන් වෙන් වශයෙන් වාර්තාවක් පිළියෙල කර එවිය යුතු වේ.

ඇමුණුම් අංක 02

## පළාත් පාලන විශ්‍රාම වැටුප් ගෙවීම් (මාසික වියදම් වාර්තා)

(පළාත් පාලන සේවා/ පළාත් පාලන වැන්දඹු අනත්දරු/ පළාත් පාලන වැන්දඹු පුරුෂ හා අනත්දරු)

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම: ........................................................................

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නම | විශ්‍රාමිකයන් ගණන | අදාළ මාසය සඳහා දරණ ලද වියදම | නතර කරන ලද විශ්‍රාම වැටුප් පිළිබඳ විස්තර | |
|---|---|---|---|---|
| | | | වි.වැ. අංකය | නම |
| | | | | |

- පළාත් පාලන සේවා/ පළාත් පාලන වැන්දඹු අනත්දරු/ පළාත් පාලන වැන්දඹු පුරුෂ හා අනත්දරු සඳහා වෙන් වෙන් වශයෙන් වාර්තාවක් පිළියෙල කර එවිය යුතු වේ.